PR/2019/10S


# ජපන් තානාපති කාර්යාලය

නො 20, ශ්‍රීමත් ආර්.ජී.සේනානායක මාවත, කොළඹ 7,  ශ්‍රී ලංකාව

දු.ක :94-11-269-3831~3, ෆැක්ස් 94-11-269-8629

ඊ මේල්: cultujpn@sltnet.lk


පෙබරවාරි 27, 2019

## පුවත්පත් නිවේදනය

### ජපන් භාෂාව ඉගෙනීම නව ක්‍රමයට
### -රජරට විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨයේ භාෂා විද්‍යාගාරයකට ජපානයෙන් ආධාර-

ජපන් රජය මගින් ක්‍රියාත්මක බිම් මට්ටමේ සංස්කෘතික ව්‍යාපෘතිය සඳහා වන ආධාර වැඩසටහන යටතේ, රජරට විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨයේ ජපන් භාෂා විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට රුපියල් මිලියන 12ක ආධාර මුදලක් ලබාදීමට එම රජය තීරණය කර ඇත.

මේ සඳහා වන ගිවිසුම ශ්‍රී ලංකාවේ ජපන් තානාපති ගරු අකිරා සුගියාමා මහතා සහ රජරට විශ්ව විද්‍යාලයේ උපකුලපති ආචාර්ය බී.ඒ. කරුණාරත්න මහතා අතර 2019 පෙබරවාරි 27 වන දින කොළඹ පිහිටි ජපන් තානාපති නිල නිවසේදී පැවැත්විණි. මේ සඳහා නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය රවුෆ් හකීම් මහතා ඇතුළු ආරාධිත අමුත්තන් පිරිසක් සහභාගි වූහ.

ජපානය වඩ වඩාත් විදේශ ශ්‍රමිකයන් සඳහා රැකියා අවස්ථා පුළුල් කරන අවධියක, මෙම ආධාර ව්‍යාපෘතිය ප්‍රායෝගික ජපන් භාෂා අධ්‍යාපනයට වඩාත් ඵලදායී වේ.

කණ්ඩායම් අධ්‍යාපනය මත පදනම් “ක්‍රියාකාරී ඉගෙනුම” සහ ජපන් පදනම මගින් ප්‍රකාශිත නව පෙළපොත ඔස්සේ, රජරට විශ්ව විද්‍යාලය ප්‍රායෝගික ජපන් භාෂා අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත්කරයි.

මෙම ව්‍යාපෘතිය ජපානය සහ ශ්‍රී ලංකාව අතර ශාස්ත්‍රීය සහ සංස්කෘතික හුවමාරුව නගාසිටුවීමත් දෙරට අතර අවබෝධය වර්ධනය කිරීමටත් උපයෝගී වෙතැයි ශ්‍රී ලංකාවේ ජපන් තානාපති කාර්යාලය බලාපොරොත්තු වේ.

*************************************************************

වැඩි විස්තර සඳහා සංස්කෘතික අංශය අමතන්න

දු.ක :94-11-269-3831~3 ( දිගුව- 231)